**කළමනාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගම - 2016**

---

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ කළමනාකරණ සේවා රක්ෂණ (පෞද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය“) වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.
මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**වෙනත් නීති හා රෙගුලාසි වාර්තා කිරීමේ අවශ්‍යතාව**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) පරිච්ඡේදයේ අවශ්‍යතාව පරිදි පහත සඳහන් ප්‍රකාශ කරමි.

(අ) විගණන මතය සඳහා වූ පදනම හා විෂය පථය හා සීමා කිරීම් ඉහත සඳහන් කර ඇත.

(ආ) මාගේ විගණන මතය

- විගණනය සඳහා සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වාගෙන ගොස් ඇති බව මා විසින් විගණනය සඳහා ලබා ගන්නා ලද තොරතුරු හා පැහැදිලි කිරීම් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.
- 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 පරිච්ඡේදයේ අවශ්‍යතාවයට සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුකූල වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

පහත ක්ෂේත්‍රයට අදාල තහවුරු කිරීම් විගණනය සඳහා ලැබී නොතිබුණි.

සමාගමට එදිරිව කිසියම් නඩුවක් හෝ සමාගම විසින් ගොනු කරන ලද කිසියම් නඩුවකට අදාල නීතිඥවරුන්ගේ තහවුරු කිරීම්

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල සාරාංශය

සමාලෝචිත වර්ෂයේ හා පසුගිය වර්ෂයේ විවිධ අවස්ථාවන්හි මූල්‍ය ප්‍රතිඵලයේ සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1. අනාර්ථික ගනුදෙනු

----------------------

මෙම සමාගම පිහිටුවීමේ එකම අවශ්‍යතාවය වූයේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා කළමනාකාරීත්වයට මෙම සමාගම හරහා වැටුප් ගෙවීම් සිදුකිරීමයි. වෙනත් සමාගමක් නඩත්තු කිරීම හේතු කොටගෙන 2016 වර්ෂය තුල රු. 49,368,850 ක අමතර ගාස්තුවක් දැරීමට සිදුවී තිබුණි. වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| එකතු කිරීමේ අගය මත බදු (VAT) | 41,060,292 |
| ජාතිය ගොඩනැගීමේ බදු (NBT) | 6,716,949 |
| විගණන ගාස්තු | 117,500 |
| බදු උපදේශන ගාස්තු | 204,032 |
| සමාගම ලියාපදිංචි කිරීමේ ගාස්තු | 60,000 |
| ආදායම් බදු | 903,491 |
| ලේකම්ගේ රාජකාරී කටයුතු ගාස්තු | 23,536 |
| ලංකා හාම්පුතුන්ගේ සංගමය සඳහා සාමාජිකත්ව ගාස්තු | 283,050 |
| එකතුව | 49,368,850 |

### 4.2 වෙනත් සංවිධාන වල සම්පත් උපයෝජනය

--------------------------------------------------

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් දේපළ හා එහි කාර්ය මණ්ඩලය මෙම සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා වර්තමානයේ යොදා ගත්තද ඒවා සමාගමට සිදු කරන සේවාවන් ලෙස සැලකීමට සහ එම සේවාවන් වල වටිනාකම ගිණුම් වලට ඇතුලත් කිරීමට කටයුතු කර නොතිබුණි.

| | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | |
|---|---|---|
| | **2016** | **2015** |
| | **රු.** | **රු.** |
| කළමනාකරණ ගාස්තු | 345,013,433 | 323,109,376 |
| **ආදායම** | **345,013,433** | **323,109,376** |
| පරිපාලන වියදම් | 337,553,849 | 320,046,411 |
| පොදුකාර්ය සේවා | 1,881,718 | 290,194 |
| වෙනත් වියදම් | 4,445,360 | 704,046 |
| **මුළු වියදම** | **343,880,927** | **321,040,651** |
| **බදු පෙර ලාභය** | **1,132,506** | **2,068,725** |
| ආදායම් බදු වියදම | (1,132,506) | (2,068,725) |
| බදු පසු ලාභය/(අලාභය) | - | - |